# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2167/11 - 2020 මාර්තු මස 18 වැනි බදාදා - 2020.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 මාර්තු මස 19 වැනි දින සිට ආරම්භ වන මාස 02ක් වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මාර්තු මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 01 | 38.08 | 3808.94.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 1.00 |
| 02 | 63.07 | 6307.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 1.00 |


1A - PG 4946 — 567 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*